
ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත

LP - QD / 21/ News/ 2012

ක්‍රි. ව. 2012 ජනවාරි 30 සඳුදා
04 වෙළුම - 14 කලබ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00

# ළමා ප්‍රදීපය




## 38 වෙනි ලංකා අප ස්වාමි දූ ගේ

## ජාතික මංගලෝත්සවය තේවත්ත පුදබිමේ දී

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.lk

# තේවත්ත බැසිලිකාවේ අතීත කථාව ඔබත් දැන ගත යුතුයි.

**ආදරණීය දුවේ පුතේ...**

මේ දින වල මුළු මහත් රටම කථා කරන්නේ 64 වන ජාතික නිදහස් සමරුව ගැනයි. පෙබරවාරි 04 වන දින සමරනු ලබන ජාතික නිදහස් උත්සවය දේශයක් හැටියට එලෙස උත්කර්ෂවත්ව සමරන විට කතෝලික අපත් ශ්‍රී ලංකා රාණි මෑණියන්ගේ මංගල්‍යය මෙදිනම සමරන්නට කටයුතු කරනවා. තේවත්ත පුදබිමේ විරාජමානව බැබලෙන ජාතික බැසිලිකාවෙ සමරනු ලබන ලංකා අප ස්වාමිදුගේ නැතිනම් ශ්‍රී ලංකා රාණි මෑණියන්ගේ මේ අසිරිමත් මංගල්‍යයටත් දිගු අතීතයක් තිබෙනවා. ආදර දුවේ පුතේ, 64 වෙනි ජාතික නිදහස් උළෙල පිළිබඳව පහන් සිතිවිලි එලෙස අපි මතකයට ලංකර ගන්නා විට 38 වෙනි වරටත් පවත්වන ලංකා අප ස්වාමිදුගේ මංගලෝත්සවය පිළිබඳවත් දැහැමි සිතිවිලි ඇති කර ගන්නට අපි එහි අතීතය කරා පිය නංවමු.

16 වන ශතවර්ෂයේ ප්‍රැන්සිස්කන් තාපසයන්ගේ ආගමනයත් සමඟම විවිධ නාමයන් යටතේ නිර්මල මරියාවන්ට භක්ති අභ්‍යාස පැවැත්වීමේ පිළිවෙතට අප දේශය තුළ මනා අත්තිවාරමක් වැටුනා. මුළු ත්‍රි සිංහලයේම ඇගේ ගෞරවය පැතිරී ගියා. බෙනදික්තානු නිකාය, ජේසු නිකාය, නිර්මල මරිය නිකාය හරහා ධර්මදූතයන් කාලයත් සමඟම එකිනෙකා සමඟ තරඟයට මෙන් ලක්දිව කතෝලිකයන්ගේ ජීවන රටාවේ ආවේණික ලක්ෂණයක් බදු නිර්මල මරියාවන් කෙරෙහි ඇති භක්ති ගෞරවාදරය තහවුරු කිරීමට අවවාදයන් හා ආදර්ශයන් ලබා දුන්නා.

ආදර දුවේ පුතේ, මරිය වහන්සේගේ ආධ්‍යාත්මික මාතෘක බල පෑම කතෝලික ජීවිත අත්දැකීමේ මහඟු දායාදයක් වැනියි, බලන්න, යාපනයේ, ප්‍රාතීහියේ අප සවාමිදුගේ දේවස්ථානය, කොළඹ ලීවර මෙන්තෝ මාතාවගේ දෙව්මැදුරේ මෙන්ම මාතර අප සවාමිදුගේ හා මඩු වන්දනා සිද්ධස්ථානයේදී දනය කරන වරප්‍රසාදවලින් විශ්වාසයේ තහවුරු වීමක් හා ආධ්‍යාත්මික සංවර්ධනයක් නොලබන බැතිමතකු අද නොමැති තරම් නේද? මේ සියල්ල අතීතයේදී දමන ලද ඉතාමත් සවිමත් අත්තිවාරම් බවට පත්වී තිබුනා. ඒ පමණක් නොවෙයි, සාන්ත අගෝස්තීනු තාපස නිකායේ තාපසයන් අත්තනගල්ලේ ''සිංහලයේ අප සවාමිදු'' යනුවෙන් දේවස්ථානයක් ඉදි කොට ශ්‍රී ලංකාව හා එහි ජනතාව මරිය තුමියට කැප කොට තිබුනා.

ආදර දුවේ පුතේ, ඒ පසුබිමත් සමඟයි අපි තේවත්ත පුදබිම බිහිවීම ගැන කථා කල යුත්තේ. මේ තේවත්ත පැරණිම පුදබිම 1911 දී ගරු ඒ.කීගර් නි.ම.නි. පියතුමා ආරම්භ කොට තිබූ අතර 1917 වර්ෂයේදී ගරු. සී. කොලරෙක් නි.ම.නි. පියතුමා විසින් සම්පූර්ණ කොට තිබුනා. දේවස්ථානයේ ළිඳට පැත්තකින් කුඩා වූ මුල්ම ගුහාව සෑදීමේ වැඩ කටයුතු සඳහා අවශ්‍ය මුදල් කොළඹ සීමාසහිත බ්‍රවුන් සහ සමාගමේ සේවකයන්ගෙන් ලැබී තිබුනා. එය 1917 නොවැම්බර් මස 11 වන දින උත්සවාකාරයෙන් විවෘත කර ඉන් පසුව වන්දනා කරුවන් වෙනුවෙන්ද විවෘත වුනා. පසුව 1931 දී විශාල ගුහාව තනවන ලද අතර 1932 පෙබරවාරි 16 වන දින එය ආශිර්වාද කරමින් අගරදගුරු මාර්ක් හිමි 11 වන පියුස් පාප්තුමා තමන්ට තෑගි කල කිරිගරුඬ අල්තාරයක්, ගුහාවට පරිත්‍යාග කළා.

මෙහි ප්‍රධානතම අංගයක් වුයේ සෑම අවුරුද්දකම අගෝස්තු මාසයේ අවසන් ඉරුදින පවත්වන ලෙඩුන් ආශිර්වාද කිරීමේ මංගල්‍යයයි. මේ කාලයේ තවත් අපූරු සිදුවීමක් සිදුවුනා. 1942 දී එදා පැවති දෙවන ලෝක යුද්ධයේ අඳුරු සෙවනැලි අප වෙතටත් ලං වුනා. පාස්කු ඉරුදින ජපනුන්ගෙන් කොළඹට බෝම්බ වැස්සක් වැටුනා. ත්‍රිකුණාමලයටත් මේ ඉරණම අත්වුනා. සෑම රදගුරු වසමකට යාච්ඤා කන්නලව් ආරම්භ වුනා. භාර භාර මධ්‍යයේ නිල නිවේදන නිකුත් වුනා. එවකට අගරදගුරු පදවිය භාරව කටයුතු කළ අති උතුම් ජීන් මේරි මැසොන් හිමියන් තම සැදැහැවත් ජනතාව බේරා ගැනීමේ පරම අභිලාෂයෙන් නිර්මල දේව මාතාවන්ට ඉතා බලසම්පන්න බාරයක් වෙමින් එය අනාවරණය කළා. රට බේරා දුන හොත් දේවස්ථානයක් ගොඩ නගා මරිය බැතිය ව්‍යාප්ත කරන්නට එතුමානන් පොරොන්දුවක් වෙනු ලැබුවා. ලංකාව යුධ උවදුරෙන් බේරුනා. මෑණියන්ගේ පිහිටාධාරය තුළ බේරා ගත් ශ්‍රී ලංකාවේ විශාලතම බැසිකාව ගොඩ නැංවීම ආරම්භ වුනා. 1947 පෙබරවාරි 05 වන දින අගරදගුරු හිමි ප්‍රමුඛ දිවයිනේ සියළුම රාජගුරු හිමිවරුන් පැරණි ගුහාවට එක්ව දේවමාතාවන් ලංකාවේ අප සවාමිදු ලෙසට ප්‍රකාශ කිරීමක් කලා.

1950 ජූලි 15 වන ද අගරදගුරු තෝමස් කුරේ හිමි විසින් පළමු පස් පිඩැල්ල කපා ආරම්භ කළ එහි වැඩ කටයුතු 1974 වසරේ දී අවසන් අදිරය දක්වා ගමන් කොට පෙබරවාරි 03 වන දින ජාතික තුති පිදීමේ හා කැපකිරීමේ මෙහෙය පවත්වා උත්කර්ෂවත්ව ජාතික බැසිලිකාව අභිෂේක කලා.

අද වන විට තේවත්ත ජාතික බැසිලිකාව ජාතික සම්පතක් සේ නම් කොට තිබෙනවා. එහි අතීතය අපට පවසන්නේ අප දේශයේ ජනතාවගේ අඛණ්ඩ, අමිල විශ්වාසයේ දිවි පෙවෙතයි. එය ඉදිරියටම ගෙන යාමේ උදර කටයුත්ත පැවරෙන්නේ පුංචි ඔබටයි. ඔබ එයට සූදානම් නේද?

ඔබ සැමට ජේසු පිහිටයි !

සංස්කාරක
ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා

# ජේසුස් වහන්සේගේ ජීවිතය, ආදර්ශයට ගෙන ළමා ඔබත් සැබෑ ධර්ම දූතයෙක් වෙන්න ......

## ළමා වින්සන් ද පාවුලා දයා සේවාවට එක්වූ ළමුන් ට කුරුණෑගල රදගුරු හිමිපාණෝ ඇරියුම් කරති !

1987 මැයි 15 වැනිදා කුරුණෑගල අපේ පදවිය ආරම්භ කලා. 2012 අවුරුද්දට අවුරුදු 25 ක් සම්පූර්ණ වෙනවා. මේ කාලය තුළදි ඔබේ දෙමාපියන්, පදවියේ වැඩිහිටියන් දහම් කෙත අස්වද්දන්න හුගක් මහන්සි වුණා. වින්සන්ද පාවුලා සමිතිය තුළින්, ඒ ජේසුගේ පණිවිඩය ලෝකෙට බෙදලා දෙන්න. ඔබත් සැබෑ ධර්මදූතයෙක් වෙන්න. ජේසු කිව්වා යන්න ලෝකෙට මගේ සුභාරංචිය පතුරුවන්න කියලා උන්වහන්සේ එතුමාගේ ප්‍රසිද්ධ ජීවිතයේදි එය කරලත් පෙන්නුවා. ජේසුගේ ප්‍රසිද්ධ ජීවිතය පටන් ගත් තැනම උන්වහන්සේගේ පළමු දූත සේවාව නැත්තම් දයාවේ සේවාව කළේ උදව් වීමයි.

ජේසු කිවුවා ''ඔබේ අසල්වැසියාටද ප්‍රේම කරන්න'' කියලා. මේ දයා ප්‍රේමය මගින් කෙරෙන්නේත් අසල්වැසියාට ප්‍රේම කිරීමයි, උන්වහන්සේගේ පනත් පිළිපැදීමයි, උගන්වනදේ පිළිපැදීමයි. මේ මගින් ජේසුව අත්දකින්න පුළුවන්. මේ දයා සේවාව තුලින් අනිත් අයට උදව්වීම, විපතේදි සංවේදි වීම හා සතුටු වන විට සතුටු වීමත් දුක්වන විට දුක බෙදා ගන්න කියලා තමයි ජේසු ඔබට කියන්නේ.

කුරුණෑගල රදගුරු අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණන් විසින් මෙම අදහස් පළ කලේ වින්සන් ද පාවුලා පදවි ළමා ධර්මදූතයන් බඳවා ගැනීමේ පළමු අවස්ථාව සඳහා තඹකන්ද කල්වාරි පුද බිමේ පැවති වැඩ සටහනේදීය.

මෙදින එක් වූ නව ළමා ධර්ම දූතික දූතිකාවන්ට නව සමාජ රටාවන් හි එහි අනුගත වීම හා ධර්මදූතසේවාවේ නියලීම පිළිබඳ උපදෙස් ලබාදුනි. එම ක්‍රියාවලිය පිළිබඳව ජාතික ආරක්ෂාව, ආපදා කළමනාකරණය, සාම අධ්‍යාපනය. පිළිබඳ අධ්‍යක්ෂ එච්.එම්. වසන්ත හේරත් මැතිතුමා විසින් ළමෝ දැනුවත් කළහ. දේශනයෙන් පසු නාට්‍ය, රචනා හා කථික තරඟ පැවත්වින.

කුරුණෑගල පදවියේ පැවත්වීමට යෝජිත රජත ජයන්ති උත්සවයට සමගාමීව තවත් අවුරුදු 25 කට වින්සන්ද පාවුලා දයා සේවාව ගැඹුරට දියත් කරමු. යන තේමාව ඔස්සේ නව ධර්ම දූත දූතිකාවන් බිහිකිරීමේ අරමුණින් පැවති මෙම ළමාරැලිය කුරුණෑගල පදවි වින්සන් ද පාවුලා අධ්‍යක්ෂ ගරු ප්‍රැන්සිස් මිල්රෝයි, පදවි ගරු සභාපති පැට්‍රික් ප්‍රේමන් විතාන, ලේකම් ඇන් විජේතුංග ප්‍රධාන සංඝය විසින් මෙහෙයවන ලද අතර පන්නල, ඉරබඩගම, කුලියාපිටිය, නිකවැරටිය, නාලවලාන, තඹකන්ද, කටුපොත මිසම්වල ළමා ධර්ම දූතික දූතිකාවන් රැසක් සහභාගී වුහ.

ගරු ප්‍රැන්සිස් මිල්රෝයි , ගරු ස්ටැන්ලි පීරිස්, ගරු පැට්‍රික් ජයකොඩි, ගරු හිලරි රූපස් තැලිස් යන පූජාප්‍රසාදින් වහන්සේලාද මෙයට සහභාගී වූහ.

මෙදින පැවති තරඟවලියේ ද ජයග්‍රාහිකාවන්ට රදගුරුහිමිපාණන් විසින් තිළිණ ප්‍රදානය කිරීම හා ළමා රැලියට ළමුන් සහභාගීවූ අයුරු ජයාරූපවලින් දැක්වේ.

✍ ජී.බී.එච්. ලිවේරා





# යහපත් එඩේර පියමං පසුපස






කොළඹ 06 සා. ලෝරන්ස් කන්‍යාරාමයේ නවක සිසුවියන් පිළිගැනීමේ උත්සවය පසුගියදා පැවැත්වුණි. මෙය 105 දෙනෙක් වූ නවක දරු කැළ හා ඔවුන්ගේ දෙමාපියන් මධ්‍යයේ පැවැත්වුණි. යාච්ඤා මෙහෙයක් මගින් එම විශේෂ අවස්ථාවට අධ්‍යාත්මික පසුබිමක් ලබාදීමට ඔවුන් සැදී පැහැදී සිටියහ. අනතුරුව පසුගිය 1 ශ්‍රේණිය සිසුවියන් විසින් නවක දැරියන් මල් දී පිළිගෙන විනෝදකාමී අංග වලින් ඔවුන් පිනවීමට ද අමතක නොකළහ. මෙදින ප්‍රධාන අමුත්තා ලෙස ශ්‍රී ලංකාවේ අපොස්තලික තනාපති අති උතුම් ජෝසප් ස්පිටේරි හිමිපාණෝ එක්වූහ. එතුමන් විසින් නවක දැරියන් ආසිරි ගන්වා යාච්ඤා මෙහෙය පුද කරන ලද අතර දෙසුමක්ද පැවැත්විය.

විදුහල්පති ගරු මේරි චන්ද්‍රිකා පෙරේරා පැවදි සොයුරිය විසින් පාසලට අලුතින් එක්වූ ළමුන්ගේ දෙමාපියන් ඇමතූ අතර එහිදී දෙමාපිය භූමිකාව පිළිබඳව පැහැදිලි කර දෙන ලදී. මෙදින අවස්ථාවක් සමග ඡායාරූපවලින් දැක්වේ.

**(ෂර්ලීන් - ශාන්ත ලෝරන්ස් පාසල් මාධ්‍ය කවය )**

## මාසික සිතිවිල්ල

මෙහි පළවන සේයාරුවට ගැලපෙන පරිදි ඔබගේ අලංකාර ගද්‍ය හා පද්‍ය නිර්මාණය අප වෙත යොමු කරන්න. ඔබ එවන නිර්මාණය සමග ඔබේ නම, ලිපිනය, ශ්‍රේණිය, පාසල, දහම් පාසල හා දුරකථන අංකය ද පැහැදිලිව ලියා පහත ලිපිනයට යොමු කරන්න.



සේයා.
සී.ආර්. ඩික්සන් ඇන්ටනි.

**මාසික සිතිවිල්ල**
"ජනවාරි මාසය"
ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.






**මෙවර කිතුනු ළමා හමුවෙන් ශු. සෙබස්තියන් මුනිදුන්ගේ ජීවිත කතාව පිළිබඳව වූ විශේෂ වැඩසටහන**

**2012 ජනවාරි 29 වන ඉරුදින ප.ව. 5.30 ට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ස්වදේශීය සේවය ඔස්සේ විකාශනය වේ. මෙදින කරුණු ඉදිරිපත් කරන්නේ ශිරාන් මෛත්‍රී මහතාය.**

ළමා ඔබගේ නිර්මාණයන් කිතුනු ළමා හමුවට යොමු කිරීමට ඔබටත් අවස්ථාවක්. වැඩි විස්තර ඉදිරියේ දී බලාපොරොත්තු වන්න.

(සංස්කාරක පියතුමා)

## වැස්ස



වහිනවා වහිනවා වැස්ස වහිනවා
කළු වලා කැළඹෙමින් විදුලි ඉරි දුවනවා
ගල් ගහන්නා වගේ වතුර කැට වැටෙනවා
අපේ මිදුල ගඟක් වෙලා වතුර ගලනවා

**පියුමි නිසංසලා**
8 ශ්‍රේණිය
ශා. ෆැන්සිස් සේවියර් දහම් පාසල
සපුගස්කන්ද

## සපුගස්කන්ද මීසමේ දහම් පාසල් ළමුන් සඳහා පැවැත්වූ ළමා ලේඛක වැඩමුළුවේදී ලබා දුන් අභ්‍යාසයේ වඩාත් සාර්ථක වූ නිර්මාණයන්



**ගංගාවක්**
දිනක්ෂි නිම්ෂාලි
6 ශ්‍රේණිය
සාන්ත. ප්‍රැන්සිස් සේවියර් දහම් පාසල - සපුගස්කන්ද

## අම්මේ



කාන්තාරයේ මිරිඟුවක් ලෙස මගේ දිවියේ
පෙණුනි මා හට ඔබ මුළු දිවියේ
ඔබ නොමැති මේ ලොවෙහි
රුදුරු සැඩ සුළඟක් වුවා මගේ දිවියේ
ඔබ දුන් අවවාද පිළිනොගතිමි අම්මේ
දැන් පසුතැවේ මතකෙට නැගෙන විටදි මගේ
ළදරු වයසේ සිටි විටදි මවේ
ඔබේ මව් සුව දැනුනේ නැත මට  අම්මේ
දැන් ඔබ මා ළඟ සිටිද්දි අම්මේ
ඔබේ අගය නොදැණුනා මට අම්මේ
බිළිඳු ලොවින් මිදිලා මගේ අම්මේ
මල්වර වුවා මගේ ඒ සිහිනේ....
දිවිය ගෙවිලා මා ලොකු වුවා මගේ අම්මේ
ඔබේ තැන අද මා සිටින්නේ අම්මේ
ඔබෙන් නොලැබුණු සෙනෙහේ අද අම්මේ
කෙලෙසද මසිතින් ඇයට පුදන්නේ....

**හෂිනි උපේක්ෂිකා ප්‍රනාන්දු**
11 ශ්‍රේණිය
ශා. ෆැන්සිස් සේවියර් දහම් පාසල - සපුගස්කන්ද

## ඔබටයි මේ හරසර

විදුණැන ඔරුවේ හබල ඔබම වේ
යහගුණ මැදුරේ පහන ඔබම වේ
අප ආදර ගුරු මව්නි පියාණනි

ආදරයෙන් සිප් සතර කියා දී
නව සිතුවිලි ඇති කලා හදේ
හොඳ මිනිසුන් පිරි ලොවක් තනන්නට
ඔබ වෙහෙසක් ගත්තා නිබඳේ
ඔබටයි මේ හරසර

**සංජලී දිල්ශාරා**
9 ශ්‍රේණිය
ශා. ෆැන්සිස් සේවියර් දහම් පාසල
සපුගස්කන්ද

## වෙල්යාය

දවස පුරා වෙහෙස වෙලා
කුඹුර කොටා සරු කරලා
වී ඉහලා පැල සිටුවා
නිදි මරලා පැල් රැකලා

නිල්ල පිරුණු වෙල් යායයි
කුඹුර පුරා විහඟ නදයි
මාළු රැන් ඇලේ රඟයි
මහද සතුට දෝරේ ගලයි

**හෂිනි කව්ෂා**
10 ශ්‍රේණිය
ශා. ෆැන්සිස් සේවියර් දහම් පාසල - සපුගස්කන්ද

# 2012 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

# ආදිපිතෘවරු සහ දිවැසිවරු

01. ආදි පිතෘවරුන් ලෙස අප හඳුන්වන්නේ කවුරුන්වද?

- ආදි පිතෘ යුගය ලෙස සලකන්නේ ක්‍රි.පූ. 2000 - 1700 අතර කාලයයි.

- ඊශ්‍රායෙල් ඉතිහාසයේ ආරම්භය සඳහන් වන්නේ, උත්පත්ති පොතේ 12 වන පරිච්ඡේදයේ සිටයි.

- සෑම අවස්ථාවකදීම ඊශ්‍රායෙලය තම ඉතිහාස කථාව ආරම්භ කරන්නේ ආදි පිතෘ ආබ්‍රහම් ගැන සිහි කරමිනි.

- ජුදා ජාතියේ ආදි පිතෘවරු වූයේ ආබ්‍රහම් ප්‍රමුඛ ඊසාක් හා ජාකොබ්ය.

02. ආබ්‍රහම් ධර්මිෂ්ඨයකු බව සනාථ කළේ දෙවියන් වහන්සේගේ (2011/ප්‍රශ්න අංක 01)

- වචන අදහා ගැනීම නිසාය

03. දෙවියන් වහන්සේ ආබ්‍රහම් සමඟ කළ ගිවිසුමට බැඳෙන්නේ, (2011/ප්‍රශ්න අංක 02)

- දෙවියන්වහන්සේ පමණි

04. පැරණි ගිවිසුම තුළ දේව අනාවරණයෙහි වැදගත් කාර්යභාරයක් ඉටුකළ දෙපිරිස වන්නේ, (2008 /04 ප්‍රශ්නය)

- ආදි පිතෘවරුන් හා දිවැසිවරුන්ය

05. උත්පත්ති 26 සහ 27 පරිච්ඡේදවලට අනුව දේව ක්‍රියාකාරීත්වය නිසා බලවතකු බවට පත්වූ නිහඬ මිනිසා වන්නේ, (2011/03 ප්‍රශ්නය)

- ජාකොබ්ය

06. දෙවියන් වහන්සේ ආබ්‍රහම්ට දෙන ලද පොරොන්දු දෙකක් ලියන්න. (2010 ප්‍රශ්නය 01/ i)

- දෙවියන් වහන්සේ ආබ්‍රහම් මගින් විශාල ජාතියක් ඇති කිරීම.

- දෙවියන් වහන්සේ ආබ්‍රහම්ට දේශයක් දෙන බව

- ආබ්‍රහම්ගේ නාමය ආසිරි පැතීමේ නාමයක් සේ කීර්තියට පමුණුවන බව.

07. ආදි පිතෘ ආබ්‍රහම්ගේ ජීවිතයේ පිළිබිඹු වන විශේෂිත ලක්ෂණය කුමක්ද ? (2009/01 ප්‍රශ්න ය i)

- විශ්වාසය

08. දිවැසිවරුන් වශයෙන් අප හඳුනාගන්නේ කව්ද?

සාමාන්‍ය පෙළ මට්ටමට අදාළව මෙය විමසා බලමු.

- ශුද්ධවූ බයිබලයේ පොත් 73 තුළ පුරාණ ගිවිසුමේ පොත් 46 කින් පොත් 15 ක් අපි දිවැසිවරුන්ගේ පොත් ලෙස හඳුන්වමු.

- දිවැසිවරුන්ගේ පොත් ප්‍රධාන කොටස් 02 කි.

    - ⋆ ප්‍රධාන දිවැසිවරු 03
    - ⋆ සුළු දිවැසිවරු 12

- ප්‍රධාන දිවැසිවරු 03 වන්නේ යෙසායා, ජෙරමියා, එසකියෙල් යන්නයි.

- එහෙත් සමහර බයිබල් විශාරදයන් දානියෙල් ගේ පොත ප්‍රධාන දිවැසි කොටසට ගැනිය හැකිය යනුවෙන් මතයක් පළ කරනවා. එය අදහසක් වශයෙන් සිසු ඔබේ මතකයේ තබාගන්න.

- දිවැසිවරු යනු කව්ද?

⋆ දෙවියන් වහන්සේ වෙනුවෙන් ජනතාවට කථා කරන්නෙකි.

⋆ දෙවියන් වහන්සේ වෙනුවෙන් පෙනී සිට උන්වහන්සේ වෙනුවෙන් කතා කරන තැනැත්තාය.

⋆ දිවැසිවරයා යනු දෙවියන්වහන්සේගේ තානාපතිවරයායා.

- දිවැසිවරුන්ට පැවරුණු ප්‍රධාන කාර්යය දෙකක් සඳහන් කරන්න. (2011/ ප්‍රශ්න අංක 01-11)

⋆ දෙවි සමිඳාණන් පිළිබඳ වඩාත් ගැඹුරු අවබෝධයක්, නොමග ගිය ඊශ්‍රායෙල් ජනතාවට ලබා දීම.

⋆ ගිවිසුම් ජීවිතයට ඊශ්‍රායෙල් ජනතාව නැවත සමීප කරවීම.

⋆ මානව සමානාත්මතාවය සහ සාධාරණත්වය ක්‍රියාත්මක කරවීම.

⋆ නොදියුණු යුගයක පවිටු පරිසරයක අදේවවාදී මිසදුටු ඇදහිලිවලට යොමුවී සිටි ඊශ්‍රායෙල් ජනතාව එකම දෙවියන් වහන්සේට වන්දනා කිරීම සඳහා යොමු කිරීම (ඒක දේවවාදය)

ගිවිසුම් සංකල්පය සහ මොසෙස් ඇසුරින් ප්‍රශ්න පත්‍ර - උත්තර ලබන සතියේදී ........

ළමා ප්‍රදීපය

# තේවත්ත බැසිලිකා පුදබිම හැඩග

## 01. ක්‍රිස්තුන් වහන්සේගේ උපත. (ක්‍රි.ව.01)



කිතු උපතේ ආරම්භය වූ පළමු සියවසරේදී ලංකාව පාලනය කළේ 1 වන භාතික තිස්ස හෙවත් භාතික අභය රජුය. මෙම රජතුමාගේ ඉතා ඉහළ විදෙස් සම්බන්ධතාවයක් තිබුණ බවට සාක්ෂි ඇත. ඉන්දියාව, පර්සියාව, සිරියාව පමණක් නොව රෝමය ඇතුළු බටහිර යුරෝපයේ රටවල් සමඟ ද සබඳතා දියුණු වී තිබිණි. රෝමයට දූත පිරිසක් යැම පිළිබඳව මහාවංශය ට ලියූ අට්ටකථාවක සඳහන් වේ. රෝමයෙන් කොරල් පබලු ගෙන්වාගෙන මහා ස්ථූපය එනම් රුවන්වැලි සෑය වැසීමට සිරෝජාලාවක් සකස් කළ බව ද සඳහන් වන්නේය. රෝම අධිරාජ්‍යයේ අවසානය දක්වා එය සමඟ දියුණු වෙළෙඳ සම්බන්ධතාවයක් තිබුණු බව ද ප්‍රකට කරුණකි. මෙය වඩාත් තහවුරු වන්නේ ලංකාවේ විවිධ ප්‍රදේශවලින් හමුවූ ලක්ෂ දෙකක් පමණ වූ රෝම කාසි කන්දරාවෙනි.



## 2. දහම් දූත මෙහෙවර පැවරීම (ක්‍රි.ව. 33)

ක්‍රිස්තුන් වහන්සේ ගෝලයන් එකොළොස් දෙනාට දේව රාජ්‍ය ගොඩනැගීමේ කාර්යය පැවරීම
(මතෙව් 28/18-20)

## 3. දහම ආසියාවේ ව්‍යාප්ත වීම ( ක්‍රි.ව. 52)



ශු. තෝමස් අපෝස්තුළුවරයාණෝ ක්‍රි.ව 52 දී ඉන්දියාවේ ක්‍රැන්ගනෝර් ප්‍රදේශයට යාබද මලියන්කර් ප්‍රදේශයට පැමිණ දහම පැතිරවීම ආරම්භ කළහ. එවකට මෙය හඳුන්වන ලද්දේ මහදේව පට්නම් යන නමිනි. ජනප්‍රවාදයට අනුව උන්වහන්සේ පැමිණියේ හම්බාන් නමැති ජුදෙ ජාතිකයකු සමඟ ය. එවක එම ප්‍රදේශයේ රජවූයේ ගොන්ඩොෆාරෙස් ෆාර්තියන් වංශික රජු ය. මෙම රජතුමා අපෝස්තුළුතුමාව ආදරයෙන් පිළිගෙන දහම් ප්‍රචාරයට ඉඩදුනි. බොහෝ කලක් යන තෙක් මෙය හුදු ජනප්‍රවාදයක් සේ පැවති කථාවක් ලෙස පිළිගැනිණි. එහෙත් පසුකලකදී කරන ලද ඓතිහාසික පර්යේෂණ අනුව සීතොපානියන් පරපුරට අයත් ගොන්ඩොෆාරෙස් නම් රජකු මේ ප්‍රදේශයේ සිටි බවටත්, ඔහු ඉතා බලසම්පන්න රජකු වූ බවටත් ඔහු නිකුත් කළ කාසිවලින් එළිදරව් වී ඇත. එම නිසා මෙය ඓතිහාසික සත්‍යයක් බවට පත්වී ඇත.

ඉන්දියාවේ කේරල සහ මලබාර් ප්‍රදේශයන්හි බ්‍රාහ්මණයන් අතරෙන් චේරා නමැති ගෝත්‍රය විසින් ක්‍රිස්තු දහම ප්‍රථමයෙන් වැළඳ ගැනිණි. ශු. තෝමස් අපෝස්තුළුවරයාණෝ ක්‍රැන්ගනෝර්වේ වැසියන්ට දහම දෙසූ අතර බොහෝ වැසියන් දහමෙහි පිහිටවූහ. දෙව් මැඳුරු 7 ක් ගොඩනැංවූහ. ක්‍රැන්ගනෝර්, මලියන්කර්, ක්විලෝන්, චායල්, කොක්කමංගලම් පලයූර් හා පර්යූර් යන ප්‍රදේශ වල දහම දෙසීහ. මෙම කාලයේ පූජකවරුන් දෙදෙනෙකු ආලේපකර ඇත. පලයූර් ප්‍රදේශය පසුව රදගුරු වසමක් හෙවත් පදවියක් ලෙස නම් කෙරිණි. (ශු. තෝමස්තුමන්ගේ කුරුසිය)

ශු. ජූඩ් තදෙවුස් සහ ශු. බර්තලෙමියුස් අපෝස්තුළුවරු පර්සියාවේ දහම පැතිරවූහ. මේ, වර්තමාන ඉරානය සහ ඉරාකය යන ප්‍රදේශයන් ය. සැසනේතියන්

# න්වන ලෝකඩ මූර්ති



අධිරාජ්‍යය වශයෙන් හැඳින්වුණු මෙහි ඇති වූ ප්‍රබල ක්‍රිස්තියානි සංඝ ඉතා දියුණු විය. මෙහි එවකට තිබුණේ සොරවැස්ටර් ආගමයි. මෙම ප්‍රදේශයේ ශු. ජුඩ් තදේවුස් මුනිතුමා දහම ප්‍රචාරය කළේය. බොහෝ දෙනෙක් දහම වැළැඳ ගත්හ.

## 4. ශු. තෝමස් අපොස්තුළුවරයා ලක්බිමේ ( ක්‍රි.ව. 52)



ඉන්දියාවේ දක්ෂිණ වෙරළත් ලංකාවේ වයඹින් පිහිටි මන්නාරමත් අතර දුර සැතපුම් 22 ක නොගැඹුරු මුහුදු තීරයකි. මෙම තීරයේ මසුන් මැරීම සහ මුතු කිමිදීම කෙරිණි. දකුණු ඉන්දියාවේ ක්රේයා, පරවර යන කුල ගෝත්‍රිකයෝ වැඩිපුර මෙහි නියැලුනහ. මොවුන් මගින් ද යාබදව පිහිටි අප රටේ කිතු දහම පෝෂණය වන්නට ඇතැයි සිතිය හැකිය. ශු. තෝමස් තුමා ලංකාවට ද පැමිණියේ ය. එතුමා ලංකාව තුළ දහම පැතිරවීමේ ආරම්භය විය. පසු කලෙක කොළඹට ආසන්න ජින්තුපිටියේ සාන්ත තෝමස් නමින් දෙව්මැඳුරක් ද ඉදිවිය. ලාංකේය කිතුනුවන්ගේ පියා ජීවත් වූයේ මෙහි යැයි ක්වේරෝස් නමැති ලංකාවේ විසූ පෘතුගීසි ජාතික ඉතිහාසඥයා පවසයි. මෙහි තිබී සොයා ගත් කුඩා ගල් පුවරුවකට කොටා ඇති කුරුස ලාංඡනයකි. මෙය ශු. තෝමස් අපෝස්තුළුවරයාණෝ තම දැතින් කරන ලද්දේ යැයි කියැවේ.

## 5. පර්සියාවෙන් හා සිරියාවෙන් පැමිණි කිතුනු වෙළෙන්දෝ (ක්‍රි.ව. 345)

ලක්දිව හා සමග සාමකාමී වෙළඳාමක යෙදුණු පිරිසක් හා පර්සියන් පිරිස විවිධ රැකියාවන් සඳහා දඹදිවින් මෙරටට පැමිණි පැරැණිම කිතුනුවන් වශයෙන් සැලැකිය හැකි ය. ධීවර හා කිමිදුම් කටයුතු සඳහා ද පැමිණි මොවුන් ශු. තෝමස් තුමන් අතින් කුලවැද්දුම් ලද මුල් කිතුනුවන්ගෙන් පැවැත එන අයයි. වෙළඳාම සඳහාද පැමිණි මොවුහු සිරියන් පර්සියන් සංක්‍රමණික වෙළෙන්දෝ ය. ඔවුහු වෙළඳ තොටුපොළ අසල ජීවත් වූහ. වෙළඳ සංඝයක් පිළිබඳ කොස්මස් ඉන්ඩිකොප්ලෙයුස්ටස් නමැති ලොව පිළිගත් ඉතිහාසඥයා සිය ගත්හි සඳහන් කරයි



## 06. දඹදිවින් කිතුනු පිරිසක් (ක්‍රි.ව. 345)



ඉන්දියාවේ මලබාර් වෙරළට පැමිණි සිරියානු ජාතික කානාන්හි තෝමස් නම් වෙළෙඳ නායකයා නිසා දකුණු ඉන්දියාවේ කිතු දහම දියුණු විය. මොහු ධන බලයෙන්, පිරිස් බලයෙන් යුත් වෙළෙඳ නායකයෙකි. දකුණු ඉන්දියාවේ විසූ කිතුනුවන්ගේ අනුග්‍රහය සඳහා ඉන්දියාවට පැමිණි මොහු සමග බොහෝ කිතුනුවෝ ඉන්දියාවට පැමිණියහ. මොවුන්ගෙන් සමහරෙක් ලංකාවට පැමිණ ලංකාවේ කිතුනු සංඛ්‍යාවට එක්වූ බව ජේ. ලැබොට් නම් ඉතිහාසඥයා පවසයි.

(තවත් කොටසක් ලබන සතියේ)

# ඉංග්‍රීසි පාඩම
## විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා

General English - Grammar Lessons by courtesy of ළමා ප්‍රදීපය

**ඉදිරිපත් කිරීම - මයිකල් ඇන්ජලෝ ප්‍රනාන්දු විසිනි.** **පාඩම් අංක : 40**

## අභ්‍යාසය

<u>පහත සඳහන් වැකි වලට **some** හෝ **any** යන වචන වලින් සුදුසු පදය තෝරා ලියන්න.</u>

1. Can you give me............information about this city?
මේ නගරය ගැන විස්තර ටිකක් දෙන්න ඔබට පුළුවන්ද?

2. We didn't buy.............books. අපි පොත් මොකුත් ගත්තෙ නෑ

3. Tomorrow I am going on a picnic with ............ of my friends.
හෙට මම මගෙ යාළුවො ටිකක් එක්ක විනෝද ගමනක් යනවා.

4. Have you seen ......... good films recently?
ළගකදී ඔබ හොඳ චිත්‍රපටි මොකුත් එහෙම බැලුවද?

5. I did'nt have..........money. So I had to borrow .......... money from my friend.
මා ළඟ සල්ලි කීයක්වත් තිබුනෙ නෑ. ඒ නිසා මට යාළුවාගෙන් ඉල්ලගන්න සිද්ධවුනා.

6. Would you like to have..........tea or coffee? ඔබ තේ ටිකක් හරි
කෝපි හරි බොන්න කැමතිද?

7. I was trying to do ............ work.
මම මේ පොඩි වැඩක් කරන්නයි ලැස්ති වුනේ.

8. There are five buses. You can travel on..............bus.
බස් පහක් තියෙනවා. ඔබට යන බස් එකක යන්න පුළුවන්.

9. We have to buy.............. for Amma. What shall we buy?
අම්මට අපි මොනවහරි ගන්න ඕන.
Buy (1)............ (ඕන දෙයක් ගන්න)
Buy (2)............ fruits. (පළතුරු ටිකක් ගන්න)

10. If you don't understand ................. words please ask me.
ඔබට මොකක් හරි වචනයක් තේරෙන්නෙ නැත්නම් මගෙන් අහන්න.

11. Are there (1) .................words that you don't under-stand?
ඔබට නොතේරෙන වචන මොකුත් තියෙනවද?
Yes sir, there are (2) .................... words.
ඔව් සර්, වචන කීපයක් තියෙනවා.

12. You can select.................book you like, from this lot.
ඔබ කැමති ඕනෑම පොතක් තෝරාගන්න පුළුවන්. මේ පොත් ගොඩෙන්.

13. In the sale today.............. shirt was Rs. 300/
අද සේල් එකේ ඕනෑම කමිසයක් රු. 300/-

<u>**Some/ any/** හෝ එම වචන වලට එකතු කළ **+ body/ +thing/ +where** යනාදි වචන වලින් හිස්තැන් පුරවන්න</u>

14. There is............ at the door. දොර ළඟ කවුදෝ ඉන්නවා.

15. I didn't eat................this morning. මම අද උදේ මුකුත් කෑවෙ නෑ.

16. Does ................. like to have a tea?
තේ එකක් බොන්න කවුරුහරි කැමතිද?

17. I am not going .................tomorrow.
මම හෙට කොහේවත් යන්නෙ නෑ.

18. What are you searching for? Did you lose ....................?
මොනවද ඔබ හොයන්නෙ? මුකුත් නැති වුනාද?

19. She didn't tell me ................. ඇය මට මොකුත් කිව්වෙ නෑ.

20. He is upset about.................
He doesn't speak to................
ඔහු මොකක් හරි ගැන "අප්සෙට්" වෙලා ඉන්නෙ.
කාටවත් ඔහු කතාකරන්නෙ නෑ.

21. .................has torn my book. කව්දෝ මගේ පොත ඉරල.

22. There was hardly ...................in the road because of the rain.
වැස්ස නිසා මිනිස්සු කව්රුත් පාරෙ හිටියෙ නැති තරම්.

23. I didn't like............in that party.
ඒ පාටියෙ හිටපු කාටවත් මම කැමති වුනේ නෑ.

24. .................... should be done about this problem.
මේ ප්‍රශ්ණෙ පිළිබඳව යමක් කළ යුතුයි.

25. If..................phones while I am out ask them to call me in the evening.
කව්රුහරි මම නැති අතරෙ මට "කෝල් කලොත්" හවසට කතා කරන්න කියන්න.

26. Don't go alone. Go with .......................
තනියම යන්න එපා. කා එක්ක හරි යන්න.

27. ...............can learn English if they try.
උත්සාහ කළොත් ඕනකෙනකුට ඉංග්‍රීසි ඉගෙනගන්න පුළුවන්.

28. Where can I sit? You can sit.............. in this row.
මම කොහෙද වාඩිවෙන්නේ? මේ පේළියෙ ඕනෑම තැනක වාඩි වෙන්න.

29. .................... This medicine is available in ............. pharmacy
මේ බෙහෙත ඕනෑම ෆාමසියක තියෙනවා.

30. You can invite ........................ you like to this party.
ඔබ කැමති ඕනෑම කෙනකුට පාටියට ආරාධනා කරන්න.

**<u>None/Nobody/ Nothing/ Nowhere</u>**

<u>යන වචන යොදා හිස් තැන් පුරවන්න.</u>

31. What were you doing? ඔබ මොකද කරකර උන්නෙ.
I was doing ...................(මුකුත් නෑ)

32. Who were you talking to? කාටද? ඔබ කතා කර කර හිටියේ?
I was talking to ................ (කාටවත් නෑ)

33. How much money have you got? සල්ලි කීයක් ඔබ ළඟ තියෙනවද?
I have ................ (කීයක්වත් නෑ)

34. How may children have they got?
එයාලට ළමයි කී දෙනක් ඉන්නවද?
They have got ................... .(එක්කෙනෙක්වත් නෑ)

35. Whom did you meet? ඔබට කාවද හමුවුනේ?
I met .................. (කව්රුත් නෑ)

36. Where are you going? ඔබ කොහෙද යන්නෙ?
I am going ................ (කොහේවත් නෑ)

37. Today is a public holiday.
අද ප්‍රසිද්ධ නිවාඩුවක් නිසා සාප්පු කිසිවක් ඇරල නෑ.
So, ..........shops are open.

38. I couldn't cook today. Because there was.......... gas.
ගෑස් නැති නිසා අද මට උයන්න බැරිවුණා.

39. Please buy ............. eggs from the shop, if you want an omelette.
ඔම්ලට් එකක් ඕනනම් කඩෙන් බිත්තර ටිකක් ගේන්න.

40. .......... of the photos are clear.
ෆොටෝ එකක්වත් පැහැදිලි නෑ.



**දේව අම්මා**
දෙව්මිණි ආලෝකා
7 ශ්‍රේණිය
ශු. ඌගෝ මුනිගේ දහම් පාසල - බුරුල්ලපිටිය




**පුංචි අපේ චිත්‍ර පිටුව**

පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම, පංතිය, පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

**අපේ ගැළවුම්කරුවාණෝ**
කවිදු සත්සර
3 ශ්‍රේණිය
සුනිමල දහම් පාසල - වැලිවිට



**භාග්‍යවත් ජුසේ වාස් මුනිතුමා**
නිශාදිනී සෙනවිරත්න
9 ශ්‍රේණිය
සාන්ත මරියා දහම් පාසල - අම්පිටිය



**ඉර බැස යන හැන්දෑවක්**
දීෂාත් නීපුර සේනාරත්න.
7 ශ්‍රේණිය
ශාන්ත ප්‍රැන්සිස් සේවියර් දහම් පාසල
සපුගස්කන්ද



**මාළු ටැංකියක්**
විහංගා ශනුරි ප්‍රනාන්දු
4 ශ්‍රේණිය
ශා. මරියා ප්‍රාථමික බාලිකා විදුහල - හලාවත



**සරුංගල් යවන ළමයි**
රශ්මි හිරන්
4 ශ්‍රේණිය
සා. මරියා දහම් පාසල - මතුගම



**අපගේ දිව්‍ය භෝජනය**
ෂෙරනී ටෙනින්කා හාමිනේ
1 ශ්‍රේණිය
ශු. බාර්බරා දහම් පාසල - තලාහේන - (පිටිපන මීසම)



**වැසි දිනයක්**
හංසනි සෙව්වන්දි
7 ශ්‍රේණිය
සා. ජෝශප් දහම් පාසල - ගම්පොළ

ළමා ප්‍රදීපය





ගොඩැල්ල රෝමානු කතෝලික මිශ්‍ර පාසලේ දරු දැරියෝ විසි එක් දෙනකු ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහාන්සේ ලබාගත්හ. ගොඩැල්ල සාන්ත සෙබස්තියන් මුනිඳුන්ගේ දෙව්මැදුරේදී පැවති දේව මෙහෙය ගොඩැල්ල මීසම් පාලක ගරු මේරියස් ප්‍රනාන්දු, මීසම් සහයක ගරු නිමන්ත ප්‍රගීත් පියතුමන්ලාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. දිව බොදුන් ලැබූ දරුවන් ගරු පියතුමන්ලා සහ පැවිදි සොයුරිය සමඟ සමූහ සේයාරුවට පෙනීසිටි අයුරු. **(ඩබ්ලිව්. හෙක්ටර් ප්‍රනාන්දු)**




බුරුල්ලපිටිය මීසමට අයත් පොල්වත්ත නිර්මල හෘදයේ දෙව් මවුන්ගේ දහම් පාසලට අයත් දු දරුවන් සත් දෙනෙක් දේවස්ථානයේ මංගල්‍යයට සමගාමීව ප්‍රථම වරට දිව බොදුන් ලබා ගත්හ. දිව්‍ය මෙහෙය මීසම් සේවක ගරු සුභාෂ් චමින්ද නි.ම.නි පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. දිව්‍ය යාගයෙන් අනතුරුව දිව බොදුන් ලැබූ දරුවන් සමග මීසම් සේවක පියතුමන් හා ගරු පැවිදි සොහොයුරියන් සමූහ ජායාරූපයකට එක් වූ අයුරු. **(නිර්මාණි චංචලා)**





**සුදතුම් වරම් ලැබීම**



බදුල්ල ශා. මරියා ආසන දෙව් මැඳුරේ දී ළමුන් 73 ක් සුදතුම් වරම් ලැබීය. බදුල්ල රදගුරු අති උතුම් වින්ස්ටන් ප්‍රනාන්දු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් දේව මෙහෙය පැවැත් වුණි. සුදතුම් වරම් ලැබූ ළමුන් රදගුරු හිමිපාණන්, බදුල්ල මීසම් සේවක ගරු ප්‍රියලාල් කුරේ, මීසම් සහයක ගරු දේවරාජන් යන පියතුමන්ලා හා පුහුණු කළ ගරු ශිරානි ප්‍රනාන්දු පැවිදි සොයුරිය, සිංහල අංශය සහ දමිළ අංශය බාර ගරුවරියන් සමඟ සේයාරුවට මුහුණ දුන් අයුරු. **(ශ්‍රීකාන්ති ගුණවර්ධන)**

# සපුගස්කන්ද දහම් ළමුන්ට ලේඛක වැඩමුළුවක්

සපුගස්කන්ද මීසමේ, සා. ෆ්‍රැන්සිස් සේවියර් දහම් පාසලේ ළමුන් සඳහා ලේඛක වැඩමුළුවක් පසගිය ද එම දෙව්මැදුරේදී පැවැත්වුණි. 6 වන ශ්‍රේණියේ සිට 11 වන ශ්‍රේණිය දක්වා දහම් ළමෝ මීට එක් වූහ. ජනසංනිවේදනය, පුවත්පත් කලාව හා නිර්මාණකරණය පිළිබඳව මෙහිදී ළමුන් ව දැනුවත් කෙරෙනි. මෙදින එක්වූ ළමුන්ට ලේඛන අභ්‍යාසයක්ද ලබා දුන් අතර ඉන් සාර්ථකම නිර්මාණ ළමා ප්‍රදීපය තුළ පළකිරීම ද ළමුන්ට ලැබුණු සුවිශේෂීවූ අවස්ථාවකි. මෙම වැඩමුළුව මෙහෙයවනු ලැබුවේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතා විසිනි. සපුගස්කන්ද මීසම් සේවක ගරු ප්‍රසන්න රොහාන් පියතුමාගේ අනුශාසකත්වයෙන් ශිෂ්‍ය නායක සංගමය මගින් මෙය සංවිධානය කෙරෙනි. ආධුනික ලේඛක, ලේඛිකාවන්ට දිරියක් ලබාදීම මෙය පැවැත්වීමේ අරමුණ විය. ලේඛන අභ්‍යාසයේ අවස්ථාවන් සේයාරුවෙහි දිස්වේ. **සටහන - ශිෂ්‍ය නායක සංගමය - සේයා :- නිරංජන් පෙරේරා**





පල්ලන්සේන 'ක්වීන් ඔෆ් ඒන්ජල්ස් ' පෙර පාසලේ වාර්ෂික නත්තල් උත්සවය පල්ලන්සේන මීසම් සේවක ගරු ජයන්ත නිමල් පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි.මෙම අවස්ථාවට මීගමුව ආවේ මරියා බාලිකා විදුහලේ පෙර පාසලේ විදුහල්පතිනි ගරු විල්ෆ්‍රඩ් පැවිදි සොයුරිය සහ පළඟතුරේ දේව සංරක්ෂණයේ දියණියෝ කන්‍යාරාමයේ ගරු තනුජා පෙරේරා පැවිදි සොයුරිය ද එක් වුනි. මෙහිදී, ගරු ජයන්ත නිමල් පියතුමා හා කොළඹ සාන්ත ජොසප් විද්‍යාලයේ මීගමුව ශාඛාවේ විදුහල්පතිනි ගරු ෆෙලිසිටා මිරැන්ඩෝ පැවිදි සොයුරියද උත්සව සභාව ඇමතූහ. මෙදින අවස්ථාවක් සේයා රුවෙහි දිස්වේ. **(මෙල්වින් ද කොස්තා)**




බේරුවල සාන්ත ජෝශප් පෙර පාසලේ වාර්ෂීක විවිධ ප්‍රශංගය හා තෑගි ප්‍රදනෝත්සවය බේරුවල මීසම් සේවක ගරු හිෂාන්ත පෙරේරා පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි .

පියතුමා ළමුන්ට ත්‍යාග බෙදා දුන් අයුරු මෙහි දිස්වේ.



( ඊ. නොමාල් චන්දික ප්‍රනාන්දු )

## ධර්මදූත ළමා සමාජිකයිනට මෙන්න අනගි අවස්ථාවක් !

**ශ්‍රී ලංකාවේ ධර්මදූත ළමා සමාජයේ 25වෙනි සංවත්සරය නිමිති කරගෙන නිර්මාණය කිරීමට අපේක්ෂා කරන සංයුක්ත තැටියට ගීත රචනා කිරීමට ධර්මදූත ළමා සමාජ ළමුන්ට හා සජීවක සජීවිකාවන්ට කෙරෙන සුහද ආරාධනයයි !**

**තේමාව : "දේව රාජ්‍යය ගොඩනැගීම සඳහා මිනිස් වටිනාකම් ඉස්මතු කෙරෙන ගීතයන්"**

**පුන ගැයිය : (Chorus) සහ**

**ගැයිය දෙකක් (2 verses)**

**ඔබගේ නිර්මාණය සමඟ පහත කූපනයද පුරවා 2012 පෙබරවාරි මස 29 වෙනිදාට පෙර අප වෙත එවන්න.**

නම:- ..................................................................

ලිපිනය :- .........................................................

ධර්මදූත ළමා සමාජ
ඒකකයේ නම :- ................................................


මීසම :- ............................................................

පදවිය :- ..........................................................

මීසම් භාර පියතුමාගේ නම,
අත්සන හා නිලමුද්‍රාව :- ....................................

**අපගේ ලිපිනය :**
**ජාතික අධ්‍යක්ෂ පියතුමා**
**ශුද්ධාසනීය ධර්මදූත ළමා සමාජය**
**නො : 19, බැල්කම් පෙදෙස,**
**කොළඹ - 08.**
**දුරකථන අංකය : 011-2685673**

## ප්‍රහේළිකා අංක 28




### හරහට

1. ක්‍රිස්තුස් වහන්සේ බව්තිස්ම ස්නාපනය ලැබුවේ මෙම ගඟේදීය.
3. මෙය, දකුණතින් දෙන විට වමතට නොදැනෙන ලෙස දිය යුතු බව ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක.
4. පොරොන්දු දේශය කරා යන ගමනේ දී, ඊශ්‍රායෙල් ජනතාව රතුමුහුද .............. කළෝය. මෙහි හිස්තැනට සුදුසු වචනය .
6. මනුෂ්‍යයෙකුගේ කතාවෙන් ඔහුගේ අඩුලුහුඩුකම් හෙළිවන්නේ, පිට මෙසේ කරන විට පොණොරයෙහි රොඩු ඉතුරු වන ලෙස උපදේශනය හෙවත් සිරාක් පවසයි.
7. ........... වනිතාව සිය පවුල ගොඩනගන්නීය. යනුවෙන් හිතෝපදේශය පොතේ සදහාන් වෙයි. මෙහි හිස්තැනට සුදුසු වචනය.

### පහළට

1. සාවුල් රජතුමාගේ පුතාගේ නම.
2. මෝසෙස්, ඊශ්‍රායෙල් ජනතාවට දෙවියන් වහන්සේගේ අණ පනත් ගැන පහදා දෙමින් රූප ........... නො කරන ලෙස ප්‍රකාශ කළේය. මෙහි හිස්තැනට සුදුසු වචනය.
5. දෙවියන් වහන්සේ මිස අන් කිසිවෙකු මෙසේ නොවේයැයි ක්‍රිස්තුන් වහන්සේ එක් ධනවත් ප්‍රධානියෙකුට වදාළ සේක.

**(මෙම ප්‍රහේළිකාව පිරවීමේදි පහත සඳහන් බයිබල් පාඨ උපයෝගී කරගත හැකිය. ශු. මාක් 1, ශු. මතෙව් 6, උපදේශකයා හෙවත් සිරාක් 27, හිතතෝපදේශය 14, ද්විතිය නිති සංග්‍රහය 4/ 15, සමුවෙල් 19, ශු. ලූක් 18)**

**නිවැරදිව ප්‍රහේළිකාව පුරවා තැපැල් පත් මගින් පමණක්,**
**ප්‍රහේළිකා අංක 28, ළමා ප්‍රදීපය,**
**අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත,**
**කොළඹ 08 යන ලිපිනයට එවන්න.**

**( සැකසුම - තිළිණි දුතිකා පෙරේරා )**

ශුද්ධ ලියැවිල්ලේ දිවැසිවර චරිතාපදාන ළමා ප්‍රදීපය ඔබ වෙත රැගෙන එයි

සිව්වන කොටස

සැකසුම : තිළිණ අලහකෝන්

# දිවැසිවර ජෝනා

